බාහිර විභාග අංශය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර)- 2009

2010 ඔක්තෝබර්

## BMGT E 2065 – සංවිධාන න්‍යාය සහ සැකැස්ම

ප්‍රශ්න සංඛ්‍යාව : 07 කාලය : පැය 03 යි

**පළමු ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

(01) මතු දැක්වෙන සිද්ධිය කියවා අවසානයේ අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

### සිංහ ටයර් සමාගම

සිංහ ටයර් සමාගම තම මූලික ව්‍යාපාරික කටයුත්ත ලෙස බයිසිකල් හා ත්‍රීරෝද සඳහා ටයර් නිෂ්පාදනය කරයි. මෑතක් වන තුරුම සාර්ථකව කටයුතු කළ මෙම ආයතනය උසස් තත්ත්වයේ හා කල්පැවැත්මේ ටයර් නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් වෙළෙඳපොළ තුළ ඉහළ පිළිගැනීමක් ලබා තිබුණි. නමුත් වර්තමානයේ මෙම ආයතනය දූෂණ හා සේවක ගැටුම් වලින් පීඩා විඳිමින් සිටී. මෙම තත්ත්වය නිසා තම නිෂ්පාදන වල ගුණත්වය හා කල්පැවැත්ම අඩු වී ඇති අතර, එනිසා තම වෙළෙඳපොල අඩුවෙමින් පවතී. නිෂ්පාදන වියදම ද ඉහළ යමින් පවතී. වෙළෙඳපොළ තුළ තම තරඟකාරීත්වය වැඩි කරමින් දේශීය හා විදේශීය නිෂ්පාදන කීපයක් දැනටමත් වෙළඳපොළට පිවිස ඇත.

සිංහ සමාගම පෙර පැවති සාර්ථකත්වයට නැවත ගෙන ඒමේ අරමුණින් නව අධ්‍යක්ෂක මණ්ඩලයක් පත්කර ඇත. ඔවුන් දැනට වර්තමාන තත්ත්වය පරීක්ෂා කරමින් සිටින අතර, විසඳුමක් සොයා ගැනීම සඳහා අවශ්‍ය මාර්ග විශ්ලේෂණය කරමින් සිටී. ඔවුන්ගේ පරීක්ෂා කිරීම තුළින් පහත සඳහන් සොයා ගැනීම් සංවිධානය සම්බන්ධයෙන් හෙළිකර ඇත.

I. සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය කර්මාන්තයේ සාමාන්‍ය පිරිවැයට වඩා වැඩි බවත්, තම නිෂ්පාදන පිරිවැයෙන් වැඩි ප්‍රතිශතයක් පරිපාලන වියදම් වලින් සංයුක්ත වන බව

II. අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩිපුර මධ්‍ය මට්ටමේ කළමනාකරුවන් සිටින අතර, බොහෝවිට ඔවුන් ඉටුකිරීමට කාර්යයන් නොමැතිව සිටිනු දැකිය හැකිය.

III. පහළ මට්ටමේ කළමනාකරුවන් ද අවශ්‍ය ප්‍රමාණයට වඩා සිටින අතර, ඔවුන්ගේ කාර්යයන් සුපරීක්ෂණයට පමණක් සීමා වී ඇත.

IV. සංවිධානයේ බොහෝ සේවකයන් බුද්ධිමත්, දක්ෂ හැකියාවන්ගෙන් යුක්ත සේවකයන් වන අතර, ඔවුන්ගේ රැකියා තෘප්තිය අඩු මට්ටමක පවතී. මෙයට හේතු වී ඇත්තේ ඔවුන් සමීප සුපරීක්ෂණයට ලක් කිරීම හා රැකියා නිදහස (Autonomy) අඩුකමයි.

V. සංවිධානයේ තත්ත්ව පාලන ක්‍රියාවලියක් ඇති නමුත් එය පූර්ණව කළමනාකරණයේ කාර්යයක් ලෙස පවතී. ඒතුළ සේවක සහභාගීත්වයක් දැකිය නොහැක.

VI. ඉහළට නැඹුරුවූ සන්නිවේදනය ඇනහිට ඇත. මේ තත්ත්වය කළමනාකරණය කෙරෙහි අවිශ්වාසය හා සතුරු ආකල්පයක් සේවකයන් අතර ඇතිවීමට හේතුවී ඇත.

VII. සංවිධානයේ ආඥාදායක නායකත්වයක් පැවත ඇති අතර, තීරණ ගැනීමේදී සේවක සහභාගීත්වයක් සඳහා ඉඩ ලබාදී නොතිබුණි.

නව කළමනාකරුවන් තවදුරටත්, සංවිධානය සාර්ථකව මෙහෙයවිය හැකි තත්ත්වයක තිබෙන බව විශ්වාස කරයි. ඔවුන්ගේ අරමුණ වී ඇත්තේ පිරිවැය අඩුකිරීම හා නිෂ්පාදනවල ගුණත්වය ඉහළ නැංවීම වේ. මේ සඳහා විවිධ ක්‍රියාමාර්ග ඔවුන් යෝජනා කර ඇති අතර, සංවිධානය නැවත සැකසීම (Redesign of Organization)) සඳහා ඉහළ මූලිකත්වයක් දී ඇත. (මෙය මනඃකල්පිත සිද්ධියකි.)

(අ) ඉහත කළමනාකරණ අරමුණු ලඟාකර ගැනීම සඳහා ඔබ විසින් යෝජනා කරන ව්‍යුහාත්මක ගැලපුම් යෝජනා ණොනවාද යන්න හේතු සහිතව කෙටියෙන් පැහැදිලි

(ආ) මෙම සංවිධානය තුල සහභාගීත්ව කළමනාකරණ රටාව ගොඩනැංවීම සඳහා යොදාගත හැකි ක්‍රමයක් විස්තර කරන්න.

(ලකුණු 13)

(මුළු ලකුණු 28)

(02) (අ) සංවිධානයක පවතින මූලික කොටස් කවරේද? පහදන්න.

(ලකුණු 08)

(ආ) "වර්තමාන සංවිධාන යාන්ත්‍රික පද්ධතියක සිට ඓන්ද්‍රිය පද්ධතියක් වෙත විතැන් වෙමින් පවතී." ඔබ එකඟවේද? හේතු සහිතව ඔබගේ පිළිතුර පහදන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 18)

(03) (අ) සංවිධාන න්‍යායේ විකාශනය සම්බන්ධයෙන් හෙන්රි ෆේයෝල් (Henri Feyol) ගේ දායකත්වය විස්තර කරන්න.

(ලකුණු 08)

(ආ) "වර්තමාන සංවිධානයන්හි ක්‍රියාකාරීත්වය විග්‍රහ කිරීමට වඩාත්ම යෝග්‍ය වන්නේ ජීවන චක්‍ර ප්‍රවේශයයි." ඔබ එකඟවේද? ඔබගේ පිළිතුර සාධාරණීකරණය කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 18)

(04) (අ) වර්තමාන ගෝලීයකරණ ක්‍රියාවලිය තුල බහු ජාතික ව්‍යාපාර කළමනාකරණයේදී කළමනාකරුවන් මුහුණ දෙන සුවිශේෂතා මොනවාද යන්න විග්‍රහ කරන්න.

(ලකුණු 09)

(ආ) "පාරිසරික අවිනිශ්චිතතාවය විවිධ සංවිධාන සඳහා විවිධාකාර වේ." මේ සම්බන්ධයෙන් ඔබගේ අදහස දක්වන්න.

(ලකුණු 09)

(මුළු ලකුණු 18)

(05) විවාද කණ්ඩායමක නායකයා ඔබයි. එක්තරා ආයතනයක පැවැත්වෙන විවාදයකට ඔබගේ කණ්ඩායමට ආරාධනා කර ඇති අතර, මාතෘකා වනුයේ, "සංවිධානයක් වර්ධනයේදී නිලතන්ත්‍රවාදය යනු අත්‍යාවශ්‍යම අංගයකි" සහ "නිලතන්ත්‍රවාදයක් නොමැතිව වුවද ආයතනයට වර්ධනය විය හැක" යන්නයි. ඔබට ලැබෙන මාතෘකාව කල් ඇතුව ඔබ නොදන්නා අතර, එය තීරණය වන්නේ විවාදය ඇරඹීමට විනාඩි පහකට පෙර බැවින් මෙම මාතෘකා දෙකටම සූදානම් වීමට ඔබට සිදුව ඇත. මේ දෙකෙහිම හොඳ තරක පිළිබඳ කරුණු එකතුකර විවාදය සඳහා සැලැස්මක් සකසන්න.

(ලකුණු 18)

(06) (අ) සංවිධාන ව්‍යුහයක් සැකසීමේදී සැලකිලිමත් විය යුතු මූලධර්ම පහදන්න.

(ලකුණු 08)

(ආ) සුවසේවා පෞද්ගලික සමාගම වෛද්‍ය උපදේශන සේවා සපයන ආයතනයකි. එය ප්‍රධාන නගරයෙන් බැහැර ප්‍රදේශයක කටයුතු කරන නිසා දැඩි තරඟයකට මුහුණ නොදේ. තම පාරිභෝගිකයන්ට ගුණාත්මක සේවයක් සැපයීම මෙහි කළමනාකරණ දර්ශනය වී ඇත. මේ නිසා හුදෙක් ලාභ සඳහාම කටයුතු කිරීම සමාගමේ අදහස නොවේ. සංවිධානයේ බොහෝ සේවකයන් වෘත්තිකයන් වේ. මෙම සංවිධානය තමන්ට ගැලපෙන පාලන උපායමාර්ගයක් සොයමින් සිටියි.
මෙම සංවිධානයට ගැලපෙන පාලන උපායමාර්ගයක් හේතු සහිතව යෝජනා කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 18)

(07) පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම තුනක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. ඉගෙනුම් සංවිධාන
ii. පරිගණකගත නිෂ්පාදනය
iii. මොඩියුලර් ව්‍යුහය
iv. සංවිධාන පරිහානිය
v. යාන්ත්‍රික නිලතන්ත්‍රවාදය

(ලකුණු 6 X 3 = 18)